# ග්‍රාමීය ආර්ථිකය හා මූල්‍ය සාක්ෂරතාව

එම්.ඒ.සී.එන්. පුෂ්පකුමාර, ශාස්ත්‍රවේදී (විශේෂ) ආර්ථිකවිද්‍යා තෙවන වසර
chanakanajith1990@gmail.com

**සංක්ෂේපය**

ආර්ථිකවිද්‍යාව තුළ ඉතා විශාල වශයෙන් සාකච්ඡාවට බඳුන් වූ මාතෘකාවක් ලෙස ග්‍රාමීය ආර්ථික හා මූල්‍ය සාක්ෂරතාව යන්න පෙන්වා දිය හැකි ය. මෙම ලිපියෙන් අපේක්ෂා කරනුයේ ආර්ථික සංවර්ධන කාර්යයේ දී ග්‍රාමීය ආර්ථික සංවර්ධනය උදෙසා මූල්‍ය සාක්ෂරතාවයේ වැදගත්කම පෙන්වා දීම යි. ඒ අනුව ග්‍රාමීය ආර්ථික හා මූල්‍ය සාක්ෂරතාව යනු කුමක් ද යන්නත් එම සංකල්ප දෙකෙහි සම්බන්ධතාවයේ ස්වරූපයත් ග්‍රාමීය ආර්ථික වර්ධනය උදෙසා මූල්‍ය සාක්ෂරතාව ඉහළ නැංවීමට ගතයුතු ක්‍රියාමාර්ගත් පෙන්වා දී ඇත. මේ සඳහා සඟරා, මහ බැංකු වාර්තාව, අන්තර් ජාලය වැනි ද්විතියික දත්ත මූලාශ්‍ර යොදා ගෙන ඇත. තොරතුරු විමසා බැලිමේ දී පෙනී යන්නේ ග්‍රාමීය ආර්ථිකයේ මූල්‍ය සාක්ෂරතාව අඩු බවත් ඒ සඳහා රාජ්‍ය අංශය ක්‍රියාමාර්ග ගතයුතු බව යි. ඒ තුළින් ජාතික සංවර්ධනය උදෙසා ග්‍රාමීය අංශය දායක කරගත හැක.

**මුඛ්‍ය පදඃ** මූල්‍ය සාක්ෂරතාව, ග්‍රාමීය ආර්ථිකය

## හැඳින්වීම

සංවර්ධනය යනු පුළුල් මානව ක්‍රියාවලියකි. නූතන ලෝකයේ සෑම රාජ්‍යයක් ම සංවර්ධන ඉලක්ක සපුරා ගැනීමට විශාල උත්සායක් දරමින් සිටී. සංවර්ධනය යන්න විවිධ චින්තකයින් විවිධ ආකාරයෙන් අර්ථ නිරූපණය කර ඇත. මේ සම්බන්ධ එක් අර්ථ නිරූපණයක් පහත ආකාරයට පෙන්වා දිය හැකි ය. ඌණ සංවර්ධිත රටවල සංවර්ධනය යනු ආර්ථික වශයෙන් ඉතා පහළ මට්ටමක පවතින ග්‍රාමීය අංශයේ සිදුවන වර්ධන ක්‍රියාවලියකි. සංවර්ධන යන්න වෙසෙසින් ම සංවර්ධනය නොවූ හා සංවර්ධන වූ රටවල් අතර දිගුකාලයක් මුළුල්ලේ දැඩි අවධානයට ලක් වූ විෂයක් ලෙස දැක්විය හැකි ය. සංවර්ධනය යන්න තරම් විවේචනයට ලක් වූ වෙනත් සංකල්පයක් ආර්ථිකවිද්‍යා විෂය ක්ෂේත්‍රය තුළ නැති තරම් ය. අද වන විට සංවර්ධනය යන්න විශේෂිත වූ ද, විවිධාංගිකරණය වූ ද, වඩාත් ජනතා සිතුම් පැතුම් සමඟ සම්බන්ධ වූ ද සංකල්පයක් බවට පත්ව තිබේ. (ග්‍රාම සංවර්ධන අභ්‍යාස හා පර්යේෂණ ආයතනය, 1978).

නූතන වාණිජකරණය වූ මෙන් ම ගෝලීයකරණය වූ ආර්ථිකය තුළ මුදල්/මූල්‍යකරණයට ඉතා වැදගත් ස්ථානයක් හිමි වේ. නූතන ආර්ථිකය තුළ දක්නට ලැබෙන විශේෂිත ලක්ෂණය වනුයේ මූල්‍යමය මාධ්‍යයෙන් තොරව කිසිඳු ආර්ථිකමය ක්‍රියාවලියක් සිදු කරලිය නොහැකි වීම යි. එය පහත අදහසින් අනාවරණය වේ. මූල්‍ය ක්‍රමය හෙවත් මිල ක්‍රමය මත සැහෙන විශ්වාසයක් තබා තිබෙන ශ්‍රී ලංකාව වැනි දියුණු වෙමින් පවතින රටවල ආර්ථික කටයුතු මුදල් නැතහොත් සමස්ත මූල්‍ය ක්‍රමයෙහි වැදගත්ක ම ඉතා විශාල ය. දේශීය වෙළෙඳාම, විදේශීය වෙළෙඳාම, රටේ ආයෝජන කටයුතු, ඉතිරි කිරීම්, ආදායම් ව්‍යාප්තිය හා සේවා නියුක්තිය, වැනි වැදගත් සාර්ව ආර්ථික ප්‍රශ්න විසඳීම සඳහා ඉහත කී මූල්‍ය ක්‍රමය ඉතා ප්‍රයෝජනවත් ය. එමෙන් ම ආර්ථික කටයුතු සම්පූර්ණයෙන් ම රඳා පවතින්නේ මුදල් පරිණාමය මත ය (සෝමසුන්දර, 1991).

ශ්‍රී ලංකාව වැනි සංවර්ධනය වන රටවල සංවර්ධන ක්‍රියාවලිය හේතු කොට ගෙන ග්‍රාමීය අංශය හා නාගරික අංශය අතර වෙනසක් හටගෙන ඇත. ශ්‍රී ලංකාවේ ජනගහනයෙන් 75% ක් පමණ ග්‍රාමීය ප්‍රදේශවල වාසය කරන අතර ඔවුන්ට අවශ්‍ය ආහාර ඇඳුම් නිවාස වාසස්ථාන හා වෙනත් ප්‍රජා සේවාවන් සපයන්නේ ද ග්‍රාමීය අංශයේ දායකත්වයෙනි. රටක ආර්ථික සංවර්ධනය උදෙසා ග්‍රාමීය අංශයට සාපේක්ෂව නාගරික අංශයේ දායකත්වය ඉහළ අගයක් ගත්ත ද ග්‍රාමීය අංශයේ වැදගත්කම ඉහළ අගයක් ගනී. තව දුරටත් මෙම අංශයේ පරිමාව විශාල කළ හැක්කේ මූල්‍ය සංවිධාන හැකියාව ඉහළ නැංවීමෙනි (ආර්ථික විමසුම, 1988). මේ අනුව පෙනී යන්නේ ශ්‍රී ලංකාවේ ග්‍රාමීය අංශය වැදගත් වන බවත් ජනගහනයෙන් විශාල පිරිසක් ජීවත් වන බවත් ය.

රටක් සංවර්ධනය කරා යාමේ දී නාගරික අංශයට සාපේක්ෂව ග්‍රාමීය අංශය ද අනිවාර්යෙන් ම සංවර්ධනය විය යුතු ය. සංවර්ධනය මූල්‍යකරණය සමඟ නොමඳ සම්බන්ධතාවක් දක්නට ලැබෙන අතර, මූල්‍යකරණයෙන් උපරිම ප්‍රයෝජන ලබා ගැනීමට මූල්‍ය සාක්ෂරතාව ඉහළ මට්ටමක පැවතිය යුතු ය. ශ්‍රී ලංකාවේ සාක්ෂරතාව ඉහළ මට්ටමක පැවතිය ද මූල්‍ය සාක්ෂරතාව පහළ මට්ටමක පවතින බව අනාවරණය වී ඇත. මෙහි දී තවදුරටත් කිව හැකි කරුණ වන්නේ නාගරික අංශයට සාපෙක්ෂව ග්‍රාමීය අංශයේ මූල්‍ය සාක්ෂරතාව පහළ මට්ටමක පවතින බව යි. ඒ අනුව ඉහළ මූල්‍ය සුහසාධනයක් තුළින් සංවර්ධනය කරා යාමේ දී ග්‍රාමීය අංශයේ මූල්‍ය සාක්ෂරතාව ඉහළ නැංවීම අනිවාර්ය වේ.

මෙම ලිපිය තුළින් ග්‍රාමීය හා මූල්‍ය සාක්ෂරතා සංකල්ප හැඳින්වීමක් කර ඇති අතර, මෙම සංකල්ප දෙකෙහි සම්බන්ධතාව විස්තර කර ඇත. තව ද ග්‍රාමීය අංශයේ සංවර්ධනය උදෙසා මූල්‍ය සාක්ෂරතාවයේ වැදගත්කමත් මූල්‍ය සාක්ෂරතාව ඉහළ නැංවීමට ගතයුතු ක්‍රියාමාර්ගත් පෙන්වා දී ඇත. මේ අනුව ග්‍රාමීය ආර්ථිකය හා මූල්‍ය සාක්ෂරතාව පිළිබඳ පුළුල් අවබෝධයක් ලබා දීමට කටයුතු කර ඇත.

## ග්‍රාමීය ආර්ථිකය

පිළිගත් මතය අනුව රටක ග්‍රාමීය අංශය යනුවෙන් අදහස් කරන්නේ ජනගහනයෙන් විශාල ප්‍රමාණයක් එනම් 70% පමණ ජීවත් වන්නා වූ ද සේවා නියුක්තිය ඉහළ මට්ටමක පවතින හා ක්‍රම සම්පාදන පහසුකම්, විදුලිය භාවිතය, දුරකතන සේවා, නළ මඟින් ජලය සැපයීමේ සේවාවන්, වැනි පහසුකම් ද, පරිගණක භාවිතය, ලිවීමට කියවීමට ඇති හැකියාව ද, සාමාන්‍ය ආදායම වැනි මේ සියල්ල ම නාගරික අංශයට වඩා පහත් මට්ටමක පවතින ආර්ථික ව්‍යුහයකි (ශ්‍රී ලංකා මහ බැංකුව, 1985) සංවර්ධනය, වන හා සංවර්ධිත සියලු ම රටවල ග්‍රාමීය අංශයක් දැකිය හැකි අතර, සැබෑ ලෙසට ග්‍රාමීය අංශයක් දැකිය හැක්කේ සංවර්ධනයවන රටවල ය (මිර්ඩාල්, 2002). සංවර්ධනයවන රටවල ග්‍රාමීය අංශයේ දැකිය හැකි ලක්ෂණ කිහිපයකි. කෘෂි ආර්ථිකයක් පැවතීම, කාර්මික අංශයේ පවත්නා දුර්වලතාව සහ කෘෂි ආර්ථික රටාව නිසා ම ඇති වී තිබෙන අධික ජනගහනය, නිසාවෙන් ම ඇති වී තිබෙන දරිද්‍රතාව සහ අඩු ඉතිරි කිරීම්, සහිත ප්‍රාථමික නිෂ්පාදන කාර්යන්හි යෙදෙන මිනිස් කොට්ඨාශයක් වාසය කරන්නා වූ යම් ප්‍රදේශයක් වේ ද එය ග්‍රාමීය අංශයක් වේ. (මිර්ඩාල්, 2002) ග්‍රාමීය ආර්ථිකය අර්ථ නිරූපණය කිරීමට තවත් නිර්වචනයක් ලෙස, ගැමි ජනතාව පිළිබඳ අධ්‍යයනය කිරීමේ

දී ඔවුන් කෘෂිකාර්මික ජීවන රටාවකට සමීපස්ථ වෘත්තීන් අනුගමනය කරන ඒකකය ගැමි ආර්ථිකයට අයත් වේ (Encyclopedia Sritinica, 128).

තවත් කණ්ඩායමක් මෙම සංකල්පය වෙනත් ආකාරයකට අර්ථිකය කෘෂිකාර්මික සංවර්ධනය ඔස්සේ ග්‍රාමීය සංවර්ධනය උපාය මාර්ග කෙරෙහි සංවර්ධනය වෙමින් පවත්නා රටවල් රාශියක් කෙරෙහි අවධානය යොමුකර ඇත. එහි දී සංවර්ධන කාර්යයට රාජ්‍ය අංශය ගනු ලබන ප්‍රයත්නයන් ආර්ථික වෘද්ධියට හා ආර්ථික සමෘද්ධියට තුඩු දෙතැයි පිළිගනී. මෙහි දී වෘද්ධිය සඳහා වන විභවතාව රඳාපවතින්නේ නිෂ්පාදන තාක්ෂණය, ශ්‍රමයේ නිපුණතාව හා ඵලදායීතාව ඇතුළත්වන ග්‍රාමීය නිෂ්පාදන බලවේගවල සංවර්ධනය තුළ ය යන්න යි. නමුත් ප්‍රායෝගික තත්ත්වය වන්නේ කෘෂි අංශය තුළ ආයෝජනයෙන් රටක සංවර්ධනයට සැලකිය යුතු දායකත්වයක් නොදැක්වීම යි. මේ සඳහා මූලිකව ම බලපානු ලබන්නේ ග්‍රාමීය අංශයේ දක්නට ලැබෙන ආවේණික ලක්ෂණ හේතුවෙනි. වර්තමානයේ දී සංවර්ධන කාර්යයේ දී විශේෂයෙන් ග්‍රාමීය අංශය ඉතා වැදගත් කාර්යය භාර්යයක් මෙහි දී ඉටු කරනු ලබයි. මෙහි දී සංවර්ධන කාර්යයේ දී ග්‍රාමීය අංශයේ වැදගත්කම පිළිබඳ කතිකාවතක් ගොඩ නැගී ඇත.

සංවර්ධනය යනු නිෂ්පාදනය හා ඵලදායීතාව ආදායම් ව්‍යාප්ති විසමතාව අඩුකරලීම, රැකියා අවස්ථා ජනිත කරලීම, දිළිඳුකම මුලිනුපුටා දැමීම, සමාජ සාධාරණත්වය ඇතිකරලීම, සහ ඒ තුළින් සමස්ත සමාජය ම මෙන් ම සමාජ ආර්ථිකය ම වෙනස් කළ හැකි බව පොදුවේ ආර්ථික විද්‍යාඥයින් අර්ථ දක්ව යි. නාගරික අංශයට සාපේක්ෂව ග්‍රාමීය අංශය තුළ විවිධ වූ දුර්වලතා දක්නට ලැබේ. එනම් ග්‍රාමීය අංශයේ සාර්ථක මූල්‍යකරණයක් දක්නට නොමැති වීම හා දියුණු තාක්ෂණය භාවිතය අඩු මට්ටමක දක්නට ලැබීම, මෙයට හේතු වේ. ආර්ථිකය අතින් අඩු දියුණු මට්ටමක පවතින ග්‍රාමීය අංශයේ ක්‍රියාකාරීත්වය සමස්ත සමාජයේ සමාජීය ආර්ථික වර්ධනය උදෙසා සෘජු දායකත්වයක් ලබා දේ.

මේ අනුව රටක සංවර්ධන ක්‍රියාවලියේ දී ග්‍රාමීය අංශයේ සංවර්ධනය ඉතා වැදගත් වේ. රටක පාලක පක්ෂයේ විවිධ සංවර්ධන ප්‍රතිපත්ති හා ක්‍රියාමාර්ග අනුගමනය කිරීම තුළින් සංවර්ධනය උදෙසා ප්‍රයත්න දරණුයේ රටක සංවර්ධන උදෙසා ග්‍රාමීය අංශය බලපාන නිසාවෙන් ය. රටක පාලකයන්, ආර්ථික විද්‍යාඥයින්, දේශපාලඥයින්, සැළසුම් ක්‍රියාත්මක කරන්නන් යන සියලු ම විද්වතුන් බලවතුන් විවිධ ක්‍රියාමාර්ග අනුගමනය කරන බව ද ග්‍රාමීය ආර්ථිකයේ පවත්නා ඌණතාවන් අවම කිරීමට හේතු වී ඇත, මෙහි දී ග්‍රාමීය අර්ථිකයේ දක්නට ලැබෙන ඌණතා ලෙස පහත ඒවා වේ. එනම්,

- අධික ජනගහනය - රටක මුළු ජනගහනයෙන් 75% - 80% අතර ප්‍රතිශතයක් සිටී.
- ප්‍රාග්ධන ඌණතාව.
- සේවා නියුක්තිය හා ඌණ සේවා නියුක්තිය.
- ප්‍රමාණාත්මක නොවන යටිතල පහසුකම් ආදිය වේ.

නූතනයේ දී සෑම රාජ්‍යක් ම ග්‍රාමීය අංශයේ සංවර්ධනය උදෙසා විවිධ ක්‍රියාමාර්ග ගෙන ඇත (උදා: ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක වූ දිවි නැගුම, මග නැගුම, වැව් දහසක් සංවර්ධනය කිරීම) ආර්ථික සංවර්ධනය යන්න ගත්විට එහි විවිධ අසමතුලිතතා විද්‍යමාන වේ. විශේෂයෙන් ශ්‍රී ලංකාව වැනි තුන්වන ලෝකයේ රටවල මෙම සංවර්ධනයේ අසමානතා

බහුල වශයෙන් දක්කට ලැබේ. මෙවැනි රටවල පුද්ගලයන් අතර විවිධ අසමානතාවන් දක්නට ලැබේ. සංවර්ධනය වෙමින් පවත්නා රටක් වශයෙන් ගත් විට එම රටවල ග්‍රාමීය අංශයට සුවිශේෂි ස්ථානයක් හිමි වේ. ඊට හේතුව වන්නේ එම රටවල ජනතාවගෙන් වැඩි පිරිසක් ග්‍රාමීය ප්‍රදේශවල ජීවත් වීමත්, කෘෂිකර්මාන්තය පදනම් කරගත් සමාජ ආර්ථික රටාවකට ජනතාව හුරු වී සිටීමත් ය. ශ්‍රී ලංකාව ගත්විට මිලියන 19 ක් පමණ සමස්ත ජනගහනයෙන් 3/4 ක් එනම් 75% ක් පමණ ග්‍රාමීය ප්‍රදේශවල ජීවත් වේ. හෙක්ටයාර් මිලියන 3.5 ක් වන වගා භූමි ප්‍රමාණයෙන් 35% ග්‍රාමීය කෘෂි බිම් වශයෙන් පැවතීමත්, මුළු සේවා නියුක්ති ශ්‍රම බලකායෙන් 51% ක් පමණ ග්‍රාමීය අංශය හා බද්ධ වූ කෘෂිකර්මාන්තයේ යෙදී සිටීමත්, මුළු වගාවෙන් 76% පමණ ග්‍රාමීය ආර්ථිකයට සම්බන්ධ වීමත්, කෘෂිකර්මය දළ දේශීය නිෂ්පාදිතයෙන් 20% කට දායක වීමත් සැලකිල්ලට ගන්නා විට ග්‍රාමීය අංශය ජාතික ආර්ථිකයේ දරණු ලබන වැදගත්කම සහ එයින් කරනු ලබන බලපෑම වටහා ගත හැකි ය (ග්‍රාම සංවර්ධනය අභ්‍යාස ආයතනය, 2006).

එහෙත් ග්‍රාමීය අංශයේ දක්නට ලැබෙන විශේෂිත ලක්ෂණය වන්නේ ග්‍රාමීය අංශයේ ජීවත්වන ජනතාවගෙන් විශාල කොටසක් අන්ත දුගී බවෙන් පෙළීම යි. ඔවුන් සහනාධාර මත යැපෙමින් ජීවත් වේ. ඒ නිසාවෙන් ග්‍රාමීය අංශය සංවර්ධන කිරීමේ අවශ්‍යතාව හා වැදගත්කම පැහැදිලි කරයි. ඒ අතර,

- සැලසුම් සහගත කළමනාකරණයක් නොමැතිවීම.
- අතාර්කික හා යල්පැනගිය කෘෂිකාර්මික හුරුපුරුදු නිසාවෙන් අඩු කාර්මික ඵලදායීතාවක් පැවතීම.
- කෘෂිකාර්මික නිෂ්පාදිතවල අඩු මිල ගණන් නිසා ඇතිවන අඩු ආදායම් හා දිළිඳු බව.
- විවිධාංගීකරණය වූ ග්‍රාමීය ආර්ථිකයක් නොමැතිවීම, හා කෘෂිකාර්මික නොවන සේවා නියුක්ති අවස්ථා නොමැතිකම නිසා ශ්‍රමය උරා ගැනීමේ හැකියාව පහළ මට්ටමක පැවතිම (මහජන බැංකුව, 1996).

සංවර්ධිත සහ සංවර්ධනය වනු ලබන සියලු ම රටවල ග්‍රාමීය ආර්ථිකයක් දැකිය හැකි ය. සැබෑ ලෙස ම ග්‍රාමීය ආර්ථිකයක් දැකිය හැක්කේ සංවර්ධිත රටවල ය. (ශ්‍රී ලංකා මහ බැංකුව, 1985). ඒ අනුව ඕනෑම රටක කිනම් හෝ ආකාරයක ග්‍රාමීය අංශයක් දැකිය හැකි ය. ඌණ සංවර්ධිත රටවල ආර්ථිකය ඉහළ නැංවීම කාර්යයේ දී ග්‍රාමීය අංශයට ඉතා විශාල කාර්යභාරයක් හිමි වේ. එසේ වන්නේ එම රටවල කෘෂිකර්මාන්ත අංශය වනු ලබන ආර්ථිකයේ ප්‍රධාන අංශය වනු ලබන අතර, එය ග්‍රාමීය අංශයෙහි ප්‍රධාන ජීවනෝපාය ද වනු ලබයි. තව ද සංවර්ධනය වන රටවල ග්‍රාමීය අංශයේ සේවා නියුක්තියක් පවතින අතර, කෘෂි නොවන අංශයට අවශ්‍ය ග්‍රාමීය ප්‍රදේශවලින් බිහිවන අතිරික්ත ශ්‍රම බලකාය ලබා ගැනීමෙන් නගරයෙන් ග්‍රාමීය අංශයට අස්වැසිල්ලක් සපයනු ලබයි. මෙමගින් ග්‍රාමීය අංශයේ ශ්‍රම පීඩනය ද සමනය වන බවට මත මේ අතර පවතී. (මහජන බැංකුව, 2003).

රටක සංවර්ධනය ගැන අවධානය යොමු කිරීමේ දී නාගරික මෙන් ම ග්‍රාමීය අංශය ද සංවර්ධනය කළ යුතු බවත්, එහි දී ග්‍රාමීය අංශයද කෙරෙහි විශේෂ අවධානයක් යොමු කළ යුතු බවත් රටක ග්‍රාමීය අංශය යනුවෙන් හඳුන්වන්නේ ශ්‍රම හමුදාවෙන් 50%ක් හා

මුළු ජනගහනයෙන් 80%ක් පමණ ජීවත් වන්නා වූ ද ඔවුන්ගේ ජීවන මාර්ගයෙන් ආදායම් ලබන්නා වූ ද දළ දේශිය නිෂ්පාදිතයෙන් 25%ක් පමණ දායකත්වයක් දක්වන්නා වූ ද එහෙත් ආයතනික පහසුකම් අතින් තමත් පසුපසින් සිටින්නා වූ ද ග්‍රාමීය අංශය දැක්විය හැකි ය (ශ්‍රී ලංකා මහ බැංකුව, 1986).

නාගරික අංශයේ ඉතුරුම් සකස්වනු ලබන අංශයක් වශයෙන් ග්‍රාමීය ඉතුරුම් දැක්විය හැකි ය. මූල්‍ය ආයතන මඟින් ග්‍රාමීය අංශය තුළින් ලබන තැන්පතු හා විවේචනාත්මකව බලන කළ ඒ ආයතන මඟින් ප්‍රමාණවත් සේවාවක් සිදු නොවීම මඟින් ග්‍රාමීය අංශයේ මූල්‍ය සාක්ෂරතාවයේ දුර්වලතාවයක් දක්නට ලැබේ. මෙම තත්ත්වය කරණකොටගෙන ආර්ථික සංවර්ධනය උදෙසා ග්‍රාමීය අංශයෙන් ලැබෙන දායකත්වය අඩු බවට විවේචන එල්ල වී ඇත. මෙයින් පැහැදිලි වන්නේ ග්‍රාමීය අංශයේ මූල්‍ය අංශය ඉතා පහත් අවම මට්ටමක පවතින බව ය.

ග්‍රාමීය ආර්ථිකය සංවර්ධනය කිරීම තුළින් විපුල ප්‍රයෝජනා ලබා ගැනීමට හැකියාව ඇත. උදාහරණ වශයෙන් විදේශ විනිමය ද විශාල වශයෙන් ඉතිරි කර ගැනීමට ඇති හැකියාව නැතහොත් ආදේශක ආනයන භාණ්ඩ නිෂ්පාදනය මඟින් ආනයන වියදම් අඩු කොටගෙන ගෙවුම් ශේෂය අඩු කරගත හැකිවනු ඇත. අනෙක් අංශවලට අවශ්‍ය ප්‍රාග්ධන භාණ්ඩ හෝ අමුද්‍රව්‍ය ආනයනය කිරීමට අවශ්‍ය විදේශ විනිමය ග්‍රාමීය ආර්ථිකයේ නිෂ්පාදන අපනයනය කිරීමෙන් ලැබේ (මහජන බැංකුව, 2003).

රටක සංවර්ධනය පිළිබඳ අවධානය යොමු කිරීමේ දී නාගරික මෙන් ම ග්‍රාමීය අංශය ද සංවර්ධනය කළ යුතු බවත් ග්‍රාමීය අංශය කෙරෙහි විශාල අවධානයක් යොමු කළ යුතු බවත් රටක ග්‍රාමීය අංශය යනුවෙන් හඳුන්වන්නේ ශ්‍රම හමුදාවෙන් 50% ක් හා මුළු ජනගහනයෙන් 80% ක් ජීවත්වන්නා වූ ද ඔවුන්ගේ ජීවන මාර්ගයන් කෘෂිඅංශයෙන් ආදායම් උපයන්නා වූ ද දළ දේශීය නිෂ්පාදිතයෙන් 25% ක් පමණ දායකවන්නා වූ ද, එහෙත් ආනයනික පහසුකම් අතින් තවමත් පසු පසින් සිටින්නා වූ ද, අංශයක් ලෙස ග්‍රාමීය අංශය යන්න අර්ථ දක්වා ඇත (ශ්‍රී ලංකා මහ බැංකුව, 1986).

සංවර්ධන ක්‍රියාදාමය තුළ ග්‍රාමීය අංශයට සාපේක්ෂව නාගරික අංශයේ ජනගහනය වැඩි වූව ද සමස්තයක් ලෙස රටක ග්‍රාමීය අංශයට සාපේක්ෂව නාගරික අංශයේ ජනගහනය අඩු බවක් දක්නට ලැබේ. ගම පිළිබඳ ගැඹුරු අවබෝධයක් ලබා ගැනීමට නම් ග්‍රාමීය සමාජය පිළිබඳ පුළුල් අවබෝධයක් ලබාගත යුතු ය. සුප්‍රකට මනෝ විද්‍යාඥයෙකුවන රොබට් රෙඩ්ෆීල්ඩ් ග්‍රාමීය සමාජය අන්ත දෙකකට මැදි වූ සමාජ විශේෂයක් ලෙස දක්වයි.

## මූල්‍ය සාක්ෂරතාව

සාක්ෂරතාව යන්නට විවිධ නිර්වචනයන් තිබෙනවා සේ ම මූල්‍ය සාක්ෂරතාව යන්නට විවිධ නිර්වචනයන් දක්නට ලැබේ. සරලව ම පෙන්වා දෙන්නේ නම් පුද්ගලයන්ට මූල්‍ය සුභසාධනය අත්පත් කර ගැනීමට ඇති දැනුම යි. මූල්‍ය සාක්ෂරතාව යනු තමා ඇතුළු පවුලේ සාමාජිකයින්ට වඩා හොඳ ජීවන තත්ත්වයක් ලබා ගැනීමට මුදල් ඉපයීමට, ඉතිරි කිරීමට, වියදම් කිරීමට හා ආයෝජනය කිරීමට පුද්ගලයෙකු සතු දැනුම හැකියාව මූල්‍ය සාක්ෂරතාවය ලෙස අදහස් කෙරේ (ශ්‍රී ලංකා මහ බැංකුව, 2011) මූල්‍ය සාක්ෂරතාව පිළිබඳ ඇමරිකාවේ ජනාධිපති උපදේශක සභාවේ පැහැදිලි කිරීමට අනුව මූල්‍ය

සාක්ෂරතාවය යනු මූල්‍ය යහපැවැත්ම සඳහා මූල්‍ය සම්පත් කළමනාකරණය කිරීමට දැනුම කුසලතා භාවිත කිරීමට ඇති හැකියාව යනුවෙන් දක්වයි (ජනාධිපති වාර්ෂික වාර්තාව, 2008).

පුද්ගල මූල්‍ය සාක්ෂරතාව පමණක් චෙක්පොත තුලනය, මිල සංසන්දනය හෝ රැකියාවක් ලබා ගැනීමට ඇති හැකියාවට වඩා වැඩි යමක් වේ. එය දිගුකාලීන දැක්මක් හා සැලසුම් අනාගතය සඳහා සෑම දිනක ම එම කුසලතා භාවිතා කිරීම ආදිය මෙයට අයත් වේ. ජාතික මූල්‍ය අධ්‍යාපන සභාව විශ්වාසයකින් යුතුව හොඳ ම පුද්ගලයා පවුල ගෝලීය ප්‍රජාව ඉලක්ක කරන ඵලදායී මූල්‍ය තීරණ ගැනීමට ඇති හැකියාව, දැනුම කුසලතා ආදිය යි. මූල්‍ය සාක්ෂරතාව පුද්ගලයාගේ ජීවිත කාලයට ම අදාළ වේ. නිෂ්පාදන අංශයෙන් ගත් විට නිෂ්පාදන ඇගයීමට දැනුවත් තීරණ ගැනීමට අවශ්‍ය වන හෙයින් ද පාරිභෝගික අංශයෙන් ගත් විට බැංකු ගිණුමක් ආරම්භ කිරීමට, රන් භාණ්ඩ ආදිය උකස් කර මුදල් ලබා ගන්නා අවස්ථාවල දී විධිමත් හා අවිධිමත් යන දෙඅංශයේ සිදුවන මූල්‍ය ගනුදෙනු ආදියේ දී එම කාර්යයේ දී අනිවාර්යෙන් ම මූල්‍ය සාක්ෂරතාවක් තිබිය යුතු ය.

ගෝලීය ආර්ථික ක්‍රමය තුළ මූල්‍යමය කටයුතු ඉහළ වශයෙන් සිදුවන අතර, එහි දී මූල්‍ය තීරණවලට ඉහළ වැදගත්කමක් හිමි වේ. එකී තීරණ ගැනීමට පුද්ගලයින් සතු මූල්‍ය පරිහරණය කිරීමේ සාමාන්‍ය අවබෝධය මූල්‍ය සාක්ෂරතාවක් ලෙස සරලව නිර්වචනය කළ හැකි ය. මේ ආකාරයට බලන කළ දෛනික කටයුතුවල දී වඩාත් ඵලදායී අයුරෙන් මුදල් භාවිත කිරීමට පුද්ගලයා සතු සාමාන්‍ය අවබෝධය බවත් එය නොතිබීම වර්තමාන වාණිජ සමාජය තුළ පුද්ගලයා සතු යහපැවැත්ම විෂයෙහි ගැටළු ඇති කිරීමට හේතුවන බවත් හඳුනාගෙන ඇත (ශ්‍රී ලංකා මහ බැංකුව, 2014).

මිනිසාගේ අවශ්‍යතා අසීමිත වීමත් සම්පත් සීමිත වීමත් කරණකොටගෙන අසමතුලිතව විසිරී ඇති සම්පත් හුවමාරු කරගැනීම පහසුකර ගැනීමටත් අවශ්‍යතා පහසුවෙන් ඉටුකර ගැනීමටත් මූල්‍ය ක්‍රමය නිර්මාණය විය. මූල්‍ය ක්‍රමයට මූල්‍ය උපකරණ මූල්‍ය ආයතන මූල්‍ය යටිතල පහසුකම් මූල්‍ය වෙළෙඳපොළ යන අංග අනිවාර්ය වේ. මූල්‍ය ක්‍රමයක් තුළ පවතින උක්ත අංගයන් සම්බන්ධයෙන් පුද්ගලයා සතු සාමාන්‍ය අවබෝධය මූල්‍ය සාක්ෂරතාව වශයෙන් සරලව පෙන්වාදිය හැකි ය.

මෙම මූල්‍ය සාක්ෂරතාව යන සංකල්පයට මූල්‍ය අධ්‍යාපනය මූල්‍ය දැනුවත්භාව මූල්‍ය පරිහරණ කුසලතා ආදී සංකල්පයන් සමග සමීප සම්බන්ධතාවක් පෙන්නුම් කරේ. එහෙත් මෙහි දී මූල්‍ය කටයුතු පිළිබඳ විශේෂඥ දැනුම පිළිබඳ අවධානය යොමු නොකරන අතර මුදල්, මුදල් කළමනාකරණය පිළිබඳ පුද්ගලයා සතු සාමාන්‍ය දැනීම මූල්‍ය සාක්ෂරතාව ලෙස හඳුනාගනී (ශ්‍රී ලංකා මහ බැංකුව, 2014).

මේ සම්බන්ධයෙන් අදහස් දක්වනු ලබන Hira & Loibl මූල්‍ය සාක්ෂරතාව අර්ථ දක්වා ඇත්තේ  මූල්‍ය සාක්ෂරතාව යනු මූල්‍ය අධ්‍යාපනය යන පුළුල් විෂයේ එක් අංගයකි (ශ්‍රී ලංකා මහ බැංකුව, 2014).

එසේම මේ සම්බන්ධයෙන් පුළුල් අර්ථකතනයක් ඉදිරිපත් කරනු ලබන සර්වොන් සහ කැස්ට්නර් මූල්‍ය සාක්ෂරතාව අර්ථ දක්වා ඇත්තේ පහත ආකාරයෙනි. ''සාමාන්‍ය මූලය සංකල්ප අවබෝධ කර ගැනීමට භාවිතය සඳහා පුද්ගලයා සතු හැකියාව යි. මේ අනුව ආදායම් ඉපයීම වියදම් කිරීම සහ මූල්‍ය කළමනාකරණය කිරීම ආදිය කෙරෙහි ඵලදායී

හා වඩාත් නිවැරදි තීරණ ගැනීමට මිනිසා සතු හැකියාව මූල්‍ය සාක්ෂරතාවය වේ'' (Servon & kaestner, 2008).

මෙම නිර්වචනයට අනුව මූල්‍ය සාක්ෂරතාව සම්බන්ධයෙන් පුළුල් අර්ථකතනයක් ඉදිරිපත් කරන අතර වර්තමාන ගෝලීය ආර්ථිකය තුළ පුද්ගල අවශ්‍යතා ඉටුකර ගැනීමට නිරන්තරයෙන් මූල්‍යමය කාර්යයන්වල නිරත වීමට සිදු වේ. මුදල් ඉපයීම වියදම් කිරීම ආයෝජනය කිරීමට ද මූල්‍යකරණය පිළිබඳව, මූල්‍ය නිෂ්පාදන පිළිබඳව, මූල්‍ය ආයතන පිළිබඳ නිරන්තරයෙන් නොයෙකුත් තීන්දු තීරණ ගත යුතු ය. එම තීරණ ගැනීමට පුද්ගලයා සතු දැනුම මූල්‍ය සාක්ෂරතාව ලෙස ඉහත නිර්වචනයෙන් ගම්‍ය වේ.

මේ අනුව මූල්‍ය සාක්ෂරතාව යනු තම දෛනික කටයුතුවල දී වඩාත් ඵලදායී ආකාරයෙන් මුදල් භාවිත කිරීමට පුද්ගලයා සතු සාමාන්‍ය අවබෝධය බවත්, එය නොතිබීම වර්තමාන වාණිජවාදී සමාජය තුළ පුද්ගල යහපැවැත්ම විෂයෙහි ගැටළු ඇති කිරීමට හේතුවන බවත් හඳුනා ගත හැකි ය (ශ්‍රී ලංකා මහ බැංකුව, 2014).

පුද්ගලයෙකු මුදල් ආයෝජන කරන ආකාරය එමඟින් ඉපයීමක් ලබන ආකාරයට එය කළමනාකරණය කරන්නේ කෙසේ ද යන්න උදෙසා මූල්‍ය සාක්ෂරතාව උපකාරී වේ. සාම්ප්‍රදායික සූක්ෂම ආර්ථික විද්‍යා ප්‍රවේශයට අනුව පූර්ණ වශයෙන් තාර්කික හා දැනුවත් පුද්ගලයන් තම ඉතිරිකිරීම් හා පරිභෝජනය සම්බන්ධයෙන් වඩාත් තාර්කික තීරණයන් ගනු ලබයි. ඉහළ ආදායම් මට්ටම්වල දී ආදායමට වඩා අඩුවෙන් පරිභෝජනය සිදු කරනු ලබන අතර, ඒ හේතුවෙන් ඉතිරි කිරීම් බිහි වේ. ආදායම් ජාලය බිඳ වැටීමක දී එම ඉතුරුම් භාවිත කරනු ලබයි. මේ සම්බන්ධයෙන් අදහස් දක්වනු ලබන මොඩිග්ලියානි සහ බ්රුම්බර්ග් (1954) හා ෆ්‍රීඩ්මාන් (1957) යන විචාරකයන් දක්වන ආකාරයට පාරිභෝගිකයා ඔහුගේ ප්‍රශස්ත ඉතිරිකිරීම් හා පරිභෝජනය සිදුකරනු ලබන්නේ තම ජීවිත කාලය තුළ ආන්තික උපයෝගීතාව උපරිම වන ආකාරයට බව ඔවුන් දක්ව යි (Montiglony, 2010).

මේ සම්බන්ධව සිදු කරනු ලද අධ්‍යයනයන් තුළින් පාරිභෝගික වරණයන්, ආර්ථික පරිසරය, සමාජ ආරක්ෂක ජාලයේ ප්‍රතිලාභ යන සාධකයන් අනුව ඉහත සඳහන් කළ ආකාරයට පුද්ගල ජීවන චක්‍රයේ ප්‍රශස්තකරණ ක්‍රියාවලිය හැඩගස්වනු ලබයි. මෙම සූක්ෂම ආර්ථික ආදර්ශයන් සමාන්‍යයෙන් උපකල්පනය කරනු ලබන ආකාරයට පුද්ගලයින්ට සංකීර්ණ ආර්ථික ගණනය කිරීම් සිදු කිරීමටත් මූල්‍ය වෙළඳපොළ සමග ඵලදායී සම්බන්ධතා පැවැත්වීමටත් අවශ්‍ය ඉතුරුම් හා පරිභෝජන සැලසුම් සකස් කිරීමටත් ක්‍රියාමටත් හැකියාව පවතී. නමුත් අධ්‍යයනයක් තුළින් හඳුනා ගන්නා ලද ආකාරයට පුද්ගලයින් බහුතරයකට ප්‍රමාණවත් මූල්‍ය සාක්ෂරතාවක් නොමැත. දැනුම අත්පත් කර ගැනීමට දැරීමට සිදු වන පිරිවැය ඉහළ මට්ටමක පැවතීම ද එම තත්ත්වයට හේතු සාධක සපයනු ලබ යි.

ලුසාර්ඩි සහ මිෂෙල් (2014) අදහස් දක්වනු ලබන ආකාරයට පසුගිය දශකයට පෙර ලෝකයේ බොහෝ රටවල රජයන් විසින් සැලසුම් කර ක්‍රියාත්මක කරන ලද විශ්‍රාම සැලසුම්වලට ශ්‍රමිකයන් ඉතා අවම සහභාගීත්වයක් පෙන්නුම් කරන ලදී. වර්තමානයේ දී ඉතිරිකිරීම්, ආයෝජන හා වේගයෙන් වර්ධනය වන පෞද්ගලික විශ්‍රාම සැලසුම්කරණ පරිසරය යන සාධක මගින් පුද්ගල මූල්‍ය සාක්ෂරතාව හා සම්බන්ධ න්‍යායාත්මක පදනම හා ප්‍රායෝගිකත්වය අතර සම්බනන්ධතාව පොහොසත් කිරීමට හේතු වී ඇති බව යි.

පෘථුල න්‍යායාත්මක හා ආනුභවික අධ්‍යයන පදනමක් ආර්ථික සංකල්ප අධ්‍යයනය සම්බන්ධයෙන් පැවතිය ද පුද්ගල මූල්‍ය සාක්ෂරතාව අත්පත් කර ගැනීම හා භාවිතා කිරීම සම්බන්ධයෙන් පවතින්නේ අඩු දැනුමකි. පසුගිය වසර කිහිපය තුළ මූල්‍ය සාක්ෂරතාවය, ඉතිරි කිරීම් හා ආයෝජන අතර පවතින සම්බන්ධතාවය සහ පුද්ගල මූල්‍ය දැනුම අත්පත් කර ගැනීම සම්බන්ධයෙන් පර්යේෂණ පත්‍රිකා කිහිපයක් ඉදිරිපත් කිරීමක් ද සිදු වී ඇත. (Lusardi & Mitchell, 2008).

මූල්‍ය සාක්ෂරතාව සම්බන්ධයෙන් අදහස් දක්වනු ලබන, ඩෙලවැන්ඩේ 2008; ජප්පෙලි සහ පැඩුලා, 2013; ෂු, 2011, ඩෙලවැන්ඩෙ, 2008 ආදී පුද්ගලයන් මේ සම්බන්ධයෙන් අදහස් ඉදිරිපත් කර ඇත. ඔවුන් අදහස් දක්වන අතරම අවදානම් සහිත කොටස් හා ආරක්ෂිත බඳුම්කර හරහා කළඹ ආයෝජන බෙදාහැරීම හා ඉතිරි කිරීම් සම්බන්ධයෙන් ද්විකාල ආදර්ශයක් ඉදිරිපත් කරන ලදි. (Delavande, Rohwedder & Willis, 2008).

මෙහි දී මූල්‍ය සාක්ෂරතාවය පිළිබඳ මානව ප්‍රාග්ධනය අත්පත් කර ගැනීමේ ක්‍රියාවලිය විග්‍රහ කරනු ලබයි. මෙම ආදර්ශය අනුව පුද්ගලයින් මූල්‍ය දැනුමේ ආයෝජනය කිරීමට තීරණය කිරීම තුළින් ඔහුට ඉහළ ප්‍රතිලාභ සහිත වත්කම්වලට ප්‍රවේශ වීමේ හැකියාව ලැබේ. පුද්ගලයකු ලබන පුහුණුව හේතුවෙන් ඉහළ ඵලදායීතාවයෙන් යුක්ත මූල්‍ය වත්කම් හඳුනා ගැනීමට හා ආයෝජන පිරිවැය අඩු කිරීමට හැකියාව ඇති මූල්‍ය උපදේශකයන් වෙත යොමු වීමට හැකියාව ලැබේ. මෙහි දී කුටුම්භයන් මූල්‍ය සාක්ෂරතාවය හා සම්බන්ධ ක්‍රියාකාරීත්වය පිළිබඳ අවධානය යොමු කරනු ලබන අතර ස්වාමි පුරුෂයන් මූල්‍ය දැනුම අත්පත් කර ගැනීම විශේෂීකරණය වී සිටින අතර භාර්යාවන් තමන්ට අදාල වන අවස්ථාවන්හි දී පමණක් මෙයට යොමු වේ. උදාහරණයක් ලෙස ස්වාමි පුරුෂයා මිය යාමට පෙර ඔහුගේ මූල්‍ය සම්පත් භාවිතය පිළිබඳ දැනුම අත්පත් කර ගැනීමට උත්සහ දරයි.

මූල්‍ය සාක්ෂරතාව සම්බන්ධයෙන් වැදගත් අදහස් කිහිපයක් ඉදිරිපත් කරන ලද ජප්පෙලි සහ පැඩුලා (2013) යන විද්‍යාඥයින් දෙදෙනා විසින් ද්විකාල ආදර්ශයක් හා බහුකාල ජීවන චක්‍ර ආදර්ශයක් ගොඩනගා තිබේ. ඔවුන්ට අනුව පුද්ගල මූල්‍ය සාක්ෂරතාව හා පුද්ගලයා සතු ධනය ජීවන චක්‍රය තුළ දී එකිනෙකට දැඩි ලෙස සහසම්බන්ධතාවක් පවතිනු ලබන සාධකයන් ය. පුද්ගල මූල්‍ය සාක්ෂරතාව කෙරෙහි ආයෝජනය කිරීම අන්තර්කාල තෝරා ගැනීමක් වේ. මෙම ආදර්ශ දෙකම පොදුවේ සැලකීමේ දී මූල්‍ය සාක්ෂරතාව ඉහළ නංවා ගැනීමේ ක්‍රියාවලියේ දී පුද්ගලයන්ට ප්‍රතිලාභ හා පිරිවැය පවතී. මූල්‍ය සාක්ෂරතාව පුද්ගලයන්ට ආයෝජනය කරනු ලබන සෑම මුදල් ඒකකයකම ප්‍රතිලාභ ඉහළ නංවාගත හැකි ආකාරයේ ආයෝජනයන් වෙත යාමට හැකියාව ලබාදේ. පිරිවැය සැලකීමේ දී මූල්‍ය සාක්ෂරතාවේ ආයෝජනය සඳහා කාලය හා මූල්‍ය සම්පත් පිරිවැයක් දැරීමට සිදු වේ (Master Card Worldwide, 2013).

## ග්‍රාමීය ආර්ථික වර්ධනය සඳහා මූල්‍ය සාක්ෂරතාවේ වැදගත්කම

සංවර්ධනය වෙමින් පවතින රටවල්වල දක්නට ලැබෙන විශේෂිත ලක්ෂණය වන්නේ නාගරික අංශයට සාපේක්ෂව ග්‍රාමීය ජනගහනය ඉතා විශාල අගයක් ගැනීම යි. ශ්‍රී ලංකාව තුළ මුළු ජනගහනයෙන් 80% ක් ග්‍රාමීය ප්‍රදේශවල ජීවත් වේ (ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව, 2010). මේ අනුව ග්‍රාමීය ජනතාව ශ්‍රී ලංකා ආර්ථිකය

තුළ ඉතා වැදගත් කොටසක් බවට පත්ව තිබේ. නමුත්, ජාතික ආර්ථිකයට දක්වන දායකත්වය සාපේක්ෂව අඩු මට්ටමක පවතී. පළාත් වශයෙන් ගත් විට බස්නාහිර පළාතේ දායකත්වය 44.4%ක් වන අතර අනෙකුත් පළාත්වල දායකත්වය 55.6%ක් වේ (ශ්‍රී ලංකා මහ බැංකුව, 2013). මේ අනුව ග්‍රාමීය ජනතාව බහුල වශයෙන් සිටින අනෙකුත් පළාත්වන දායකත්වය ඉතා කුඩා අගයක් ගනී. ලාභදායීතාව අරමුණු කරගත් වාණිජ බැංකු හා අනෙකුත් මූල්‍ය ආයතන ව්‍යාප්තිය තුළින් ද මෙම තත්ත්වය හඳුනාගත හැකිය. බස්නාහිර පළාත තුළ වාණිජ බැංකු හා මූල්‍ය ආයතන 37%ක් පමණ වන විට අනෙක් පළාත් සියල්ලෙහිම 63%ක් ලෙස ව්‍යාප්තිය දැක්වේ. වාණිජ බැංකු හා මූල්‍ය ආයතන තම ශාඛා ව්‍යාප්ත කරනු ලබන්නේ ලාභදායීතාවය මත වන බැවින් ග්‍රාමීය අංශවල සාපේක්ෂව අඩු ව්‍යාප්තියක් තිබීම තුළින් පෙන්නුම් කරනුයේ ග්‍රාමීය ජනතාව විධිමත් අංශයේ මූල්‍ය ආයතන සඳහා නැඹුරු වීම සාපේක්ෂව අඩු බව යි (ශ්‍රී ලංකා මහ බැංකුව, 2013).

නමුත් සීමිත සම්පත් සුක්ෂම අන්දමෙන් ප්‍රයෝජනයට ගැනීම සඳහා තවමත් ඉඩකඩ තිබේ. කර්මාන්තයේ ප්‍රයෝජනයට අවශ්‍ය අතිරික්තය ග්‍රාමීය හා වතු අංශයේ ඇති කර්මාන්තවලින් ලැබිය යුතුය. කාර්මික අංශයේ ප්‍රයෝජනයට පමණක් නොව සමාජ ආර්ථික යටිතල පහසුකම් සැපයීමට අවශ්‍ය අතිරික්තය ලැබෙන්නේ ද මෙම අංශයෙනි. එහෙයින් ග්‍රාමීය ආර්ථිකය ශ්‍රී ලංකාවේ ආර්ථිකයේ වැදගත් ස්ථානයක් උසුලයි (ශ්‍රී ලංකා මහ බැංකුව, 1985).

ප්‍රාග්ධන පහසුකම් නොමැති වීමත් වෙළෙඳපොළ පරිමාණයත් හේතුකොට ගෙන ශ්‍රී ලංකාවේ කර්මාන්ත බිහිවීමට බාධාවක් වී ඇත. ශ්‍රී ලංකාවේ දක්නට ලැබෙන වෙළෙඳපොළ සම්බන්ධයෙන් සාකච්ඡා කිරීමේ දී, වසරකට එක්සත් ජනපද ඩොලර් 753 පමණ ඒකපුද්ගල ආදායමක් ලබන මිලියන 08 ක් පමණ පිරිසකින් සමන්විත වෙළෙඳපොළක් දක්නට ලැබේ. කර්මාන්ත බිහි කිරීමේ දී පරිමාණානුකූල පිරිමැසුම් ලබාදෙන වෙළෙඳපොළක් දක්නට නොලැබේ. කර්මාන්ත ස්ථානගත වීමට ප්‍රථමයෙන් සවිර වෙළෙඳපොළක් අවශ්‍යවන අතර, ඒ තුළින් ජාත්‍යන්තර වෙළෙඳපොළට අවතීර්ණ වීමට අවස්ථාව ලැබේ. ඇත්තෙන්ම ග්‍රාමීය ආදායම් මත දේශීය වෙළෙඳපොළ රඳා පවතී. ඒ නිසා ග්‍රාමීය අංශය දියුණු කිරීම ඉතා වැදගත් වේ (ශ්‍රී ලංකා මහ බැංකුව, 1985).

ආර්ථිකයක් වර්ධන ක්‍රියාවලිය තුළින් සංවර්ධන කරා යාමේ දී මූල්‍ය යන සංකල්පය ඉතා වැදගත් සාධකයක් වේ. මෙහි දී මූල්‍ය කරණයෙන් උපරිම ප්‍රතිලාභ ලබා ගැනීමට මූල්‍ය සාක්ෂරතාව යන්න ඉතා වැදගත් වනු ලබන අතර, එය ශීඝ්‍ර ආර්ථික වර්ධනයට හේතු වේ. ඉහළ මූල්‍ය සාක්ෂරතාවක් පැවතීම ආර්ථික වර්ධනය තීව්‍ර කිරීමට හේතුවන අතර, පහළ මූල්‍ය සාක්ෂරතාවක් පැවතීම ආර්ථික මෙන් ම සමාජ ඇති කිරීමට ගැටළු හේතු වේ (ශ්‍රී ලංකා මහ බැංකුව, 2014).

ගෝලීයකරණ මූල්‍ය ආර්ථික ක්‍රමය තුළ නිරන්තරයෙන් මූල්‍ය කටයුතුවල නිරත වීම දක්නට ලැබේ. ඉහළ මූල්‍ය සාක්ෂරතාවයක් පැවතීම තුළින් නිවැරදි මූල්‍ය ආයතනවල මුදල් ආයෝජනය කිරීමට හැකි වේ. වර්තමාන සමාජය තුළ 'පොන්සි ව්‍යාපර ආයතන' හෙවත් කලු ව්‍යාපාර (වංචනික මූල්‍ය ව්‍යාපාර) දක්නට ලැබේ මේවායෙන් බේරීමට මූල්‍යමය සාක්ෂරතාවක් තිබිය යුතුම ය. ලාභය හා අවධානම පිළිබඳ අවබෝධයක් තිබීමෙන් ආයෝජනවලින් උපරිම ප්‍රයෝජන ලබාගත හැකි ය. ඒ අනුව පැහැදිලි වන කාරණය වන්නේ ආයෝජනය ඉතුරුම් කොටස් වෙළෙඳපොළ ගනුදෙනු හා වත්කම්

කළමනාකරණයට මෙන් ම සමාජයේ බොහෝ කරුණු නිරාකරණය කිරීමට ජනයා සතුව මූල්‍ය සාක්ෂරතාවක් තිබීම ඉතා වැදගත් බව යි. (ශ්‍රී ලංකා මහ බැංකුව, 2014)

මූල්‍ය පද්ධතියක් සාර්ථකව ක්‍රියාත්මක වීමට නම් මූල්‍ය ක්‍රියාකාරීත්වයට සම්බන්ධ වී සිටින සියලු ම දෙනාට උසස් මූල්‍ය සාක්ෂරතාවක් තිබිය යුතු ය. ඉහළ මූල්‍ය සාක්ෂරතාවක් සහිත පාරිභෝගිකයන්ගෙන් යුක්ත සමාජයක මූල්‍ය ආයතන, මූල්‍ය වෙළෙඳපොළ, මූල්‍ය යටිතල පහසුකම් පද්ධතිය, මූල්‍ය උපකරණ යනාදිය ඵලදායී අයුරෙන් කළමනාකරණය කිරීම පහසු වේ (ශ්‍රී ලංකා මහ බැංකුව, 2014).

තාක්ෂණය දියුණුවීම කරණ කොට ගෙන මූල්‍ය උපකරණවල ද දියුණුවක් දක්නට ලැබේ. වර්තමාන ලොකයේ දිනෙන් දින මූල්‍ය නිෂ්පාදන නව ඉතුරුම් ක්‍රම, නව මූල්‍ය සේවා සැපයීම ශීඝ්‍රයෙන් වර්ධනය වීම දැකගත හැකි ය. ප්‍රජාව වෙත කාර්යක්ෂම මූල්‍ය සේවාවන් ලබා ගැනීමට තාක්ෂණය සමඟ මෙවැනි සේවාවන් තිබිය යුතු අතර, ඒ සඳහා පුද්ගලයා සතුව මූල්‍ය පද්ධතිය කෙරෙහි දැනුම ඉහළ මට්ටමක තිබිය යුතු ය. මේ අනුව ශීඝ්‍රයෙන් වර්ධනය වන ගෝලීය මූල්‍ය ක්‍රමයට අනුගත වෙමින් ඒ තුළින් උපරිම ප්‍රතිඵල භුක්ති විඳීමට මූල්‍ය සාක්ෂරතාව උපකාරී වේ (ශ්‍රී ලංකා මහ බැංකුව, 2014).

මෙයින් අනාවරණය වන්නේ රටක් සංවර්ධනයක් කරා යාමට නාගරික අංශයට සාපේක්ෂව ග්‍රාමීය අංශය ද සංවර්ධනය කළ යුතු බව යි. ඒ සඳහා මූල්‍ය සාක්ෂරතාව ද ඉහළ මට්ටමකින් පවත්වා ගත යුතු බව යි.

**ග්‍රාමීය ආර්ථිකයේ මූල්‍ය සාක්ෂරතාව ඉහළ නැංවීමට රාජ්‍ය අංශයට ගතහැකි ක්‍රියාමාර්ග**

ග්‍රාමීය ප්‍රජාවගේ මූල්‍ය සාක්ෂරතාව ඉහළ නැංවීමට විවිධාකාරයේ පියවරයන් ගෙන තිබෙන බව සඳහන් කළ යුතු ය. ඒ සඳහා ආයතන පිහිටු වීම්, සමීක්ෂණ පැවැත් වීම, ජාතික උපාය මාර්ග සංවර්ධනය, වැඩ සටහන් සංවිධානය හා දැනුවත් කිරීමේ වෙබ් අඩවි ආරම්භ කිරීම මේ අතරින් කිහිපයකි. මෙම විග්‍රහයේ දී බ්‍රිතාන්‍ය, ඇමරිකා එක්සත් ජනපදය, ඕස්ට්‍රේලියාව යන රටවල් ත්‍රිත්වයේ අත්දැකීම් පමණක් සාකච්ඡා කරේ.

1. නියෝජිත ආයතන පිහිටු වීම.

මේ සම්බන්ධයෙන් සාකච්ඡා කිරීමේ දී බ්‍රිතාන්‍ය, ඇමරිකා එක්සත් ජනපදය, ඕස්ට්‍රේලියාව යන රටවල් ත්‍රිත්වයේ ම මූල්‍ය සාක්ෂරතාව ඉහළ නැංවීමට විවිධ අණපනත් සම්මත කොට මෙම සම්බන්ධයෙන් කටයුතු කිරීමට විවිධ නියෝජිත ආයතන පිහිටුවා ඇත. මූල්‍ය සේවා වෙළෙඳපොළ පණතට (financial Services & Markets Act) අනුව බ්‍රිතාන්‍ය තුළ මූල්‍ය සාක්ෂරතාව ඉහළ නැංවීමට මූල්‍ය සේවා අධිකාරිය (Finacial Services Authority) නම් වූ නියෝජිත ආයතනයක් පිහිටුවන ලදී. උක්ත පනතට අනුව ජනතාවගේ මූල්‍ය සාක්ෂරතාව ප්‍රවර්ධනය කිරීම, පාරිභෝගිකයන් සුරක්ෂිතකරණය කිරීමට දැනුවත් කිරීමේ වැඩ සටහක් ක්‍රියාත්මක කිරීම, වෙළෙඳපොළ සුරක්ෂිත කිරීම, මෙම ආයතනයට අනුබද්ධ වෙනත් ආයතන පාලනය කිරීමේ බලය මෙම අධිකාරියට පවරා ඇත. මෙයට අමතරව බ්‍රිතාන්‍ය තුළ මෙම අධිකාරිය යටතේ මූල්‍ය කුසලතා සංවර්ධන ආයතන (financial skills Agency) පෞද්ගලික මූල්‍ය අධ්‍යාපන කණ්ඩායම් (personal fincial education Group) වැනි ආයතන පිහිටුවා ඇත. මෙම ආකාරයට ම ඇමරිකාවේ ද ආයතන පද්ධතියක් ස්ථාපිත කර ඇත. රාජ්‍ය හා පෞද්ගලික දෙඅංශයේ

ම මූල්‍ය සාක්ෂරතාව ප්‍රවර්ධනය කිරීම, ෆෙඩරල් රාජ්‍යයේ මූල්‍ය අධ්‍යාපන සම්බන්ධීකරණය කිරීම, ජාතික උපාය මාර්ග සංවර්ධනය කිරීම ආදී අරමුණු කරගෙන මූල්‍ය සාක්ෂරතාව හා අධ්‍යාපනය දියුණු කිරීමේ පනත (financial literacy and Education important Act) සම්මත කරන ලදී. මෙහි මූලිකත්වයෙන් මූල්‍ය සාක්ෂරතාව සහ අධ්‍යාපනය (financial literacy and Education commission) කොමිෂන් සභාව පිටුවා ඇත. මේ ආකාරයට ඕස්ට්‍රේලියාවේ ද මූල්‍ය සාක්ෂරතාව ප්‍රවර්ධනය කිරීමට මූල්‍ය සාක්ෂරතා පදනම් ආයතනය (financial literacy Foundation) පිහිටුවා ඇත.

2. දැනුවත් කිරීමේ හා වෙබ් අඩවි ආරම්භ කිරීම.

මූල්‍ය සාක්ෂරතාව ප්‍රවර්ධන කිරීමට උක්ත රටවල් තුනම දැනුවත් කිරීමේ වෙබ් අඩවි (සමාජ ජාල) පවත්වාගෙන යනු ලබ යි. බ්‍රිතානයේ මූල්‍ය සේවා අධිකාරිය ද (Finacial Services Authirity) Moneymadeclear ලෙස ද ඇමරිකාවේ මූල්‍ය සාක්ෂරතාව සහ අධ්‍යාපන කොමිෂන් සභාව (financial literacy and Education commission) Mymoney ද ඕස්ට්‍රේලියාවේ මූල්‍ය සාක්ෂරතා පදනම් ආයතනය (financial literacy Foundation) Undestanding money යනුවෙන් සමාජමය වෙබ් අඩවි මෙම රාජ්‍යන් ත්‍රිත්වයේ ම දක්නට ලැබේ. ඉගෙනුම් ආකෘති ස්වයං තක්සේරු පරීක්ෂණ ආදිය මෙම සමාජ වෙබ් අඩවි තුළ අන්තර් ගත කර තිබීම විශේෂත්වයකි. මේවා තුළ ණය පාලනය, ණය කාඩ්, බැංකු ගිණුම් රක්ෂණ කටයුතු, මූල්‍ය සැලසුම්කරණය හා පාරිභෝගික ආරක්ෂාව, මූල්‍ය සැලසුම්කරණය මුදල් කළමනාකරණය, විශ්‍රාම සැසුම්කරණය ආදී මූල්‍යකරණ කාර්යයන් මේ තුළ අන්තර් ගතකර ඇත. (ශ්‍රී ලංකා මහ බැංකු සටහන සඟරාව, 2012).

3. ජාතික උපායමාර්ග සම්පාදනය

උක්ත රටවල් තුනම මූල්‍ය සාක්ෂරතාව ප්‍රවර්ධනය කිරීමට ජාතික උපායමාර්ග සම්පාදනය සඳහා රාජ්‍ය අංශයෙන් ම කටයුතු කර ඇත. 2003 වර්ෂයේ දී බ්‍රිතාන්‍ය තුළ මූල්‍ය සේවා අධිකාරිය විසින් මූල්‍ය සාක්ෂරතාව ඉහළ නැංවීමට ජාතික උපායමාර්ග සැලැස්මක් සම්පාදනය කර ඇත. ඒ තුළින් මූල්‍ය සාක්ෂරතාව අවම කණ්ඩායම් සමීක්ෂණ තුළින් හඳුනා ගැනීම සිදු විය. මේ ආකාරයට අනෙක් රටවල් දෙකෙහි ජාතික උපායමාර්ග සැලසුම් සම්පාදනය කර ඇත. එම යෝජනාවන්ට අනුකූලව 2006 වර්ෂයේ දී මේ සඳහා සමීක්ෂණයක් පවත්වා ප්‍රතිඵල ලබා ගෙන ඇත. එයට අනුව මූල්‍ය සාක්ෂරතාව සහිත පාරිභෝගිකයන් තෝරාගෙන මුදල් භාවිතය හා මුදල් කළමනාකරණය පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන් ක්‍රියාත්මක කර ඇත.

ඇමරිකා එක්සත් ජනපදය විසින් 2006 වර්ෂයේ දී මූල්‍ය සාක්ෂරතා හා අධ්‍යාපන කොමිෂන් සභාව විසින් මූල්‍ය සාක්ෂරතාව පිළිබඳව ජාතික සැලැසුමක් සම්පාදනය කොට ප්‍රකාශයට පත්කර ඇත. ඉතිරිකිරීම් සම්බන්ධ ගැටළු, ණය ලබා ගැනීම සම්බන්ධ ගැටළු, මූල්‍ය සාක්ෂරතාවේ පවතින ගැටළු පිළිබඳව මෙහි දී සැලකිලිමත් වේ. 2007 මැදභාගය වන විට මෙම උපාය මාර්ගවලට අදාළ ක්‍රියාමාර්ග ප්‍රායෝගිකව ක්‍රියාත්මක කිරීම ආරම්භ කර තිබුණි.

එයට අනුව මහජන දැනුවත් කිරීමේ වැඩසටහන් තෝරාගත් විවිධ ජන කොටස්වලට සම්මන්ත්‍රණ පැවැත්වීම, අධ්‍යාපන මාලාවන්ට මේ පිළිබඳ පරිච්ඡේදයක් ඇතුළත් කිරීම,

ආදි පියවර රැසක් ගෙන ඇත. 2007 ඇමරිකාවේ භාණ්ඩාගාර දෙපාර්තමේන්තුවේ ප්‍රධානත්වයෙන් පර්යේෂණ සමූළුවක් පැවැත්වීමටත් ක්‍රියාමාර්ග ගෙන ඇත. මේ ආකාරයට ඇමරිකාව බ්‍රිතාන්‍ය ඇතුළු රටවල් මූල්‍ය සාක්ෂරතාවේ ඉහළ නැංවීමට ක්‍රියාමාර්ග ගෙන ඇත (සටහන සඟරාව, 2012).

මේ හැරුණු විට ඉහළ මූල්‍ය සාක්ෂරතාවක් ලබා ගැනීමට ජත්‍යන්තර අත්දැකීම් භාවිත කරමින් ශ්‍රී ලංකාවේ ප්‍රතිපත්ති සම්පාදකයන් පහත ක්‍රියාමාර්ගවලට යොමු වී තිබේ.

- මූල්‍ය සාක්ෂරතාව සමීක්ෂණ හා පරීක්ෂණ සැලසුම් කර ක්‍රියාත්මක කිරීම, විවිධ ප්‍රජා කණ්ඩායම්වල විසමතා මෙමඟින් හඳුනාගත හැකි ය.
- මූල්‍ය සාක්ෂරතාව වර්ධනය කිරීමට අවශ්‍ය විශේෂඥ දැනුම භාවිත කරමින් අවශ්‍ය විනිමය රාමුව සකසා එයට අවශ්‍ය ආයතනික රාමුව ස්ථාපිත කිරීම, එම ආයතනික පද්ධතිය හරහා පාසල් විෂය ධාරාවට මූල්‍ය සාක්ෂරතාව පිළිබඳ ඇතුළත් විෂය නිර්දේශයන් හා පාඨමාලා සකස් කර එය සියලු ම අනිවාර්ය කිරීමේ පියවර ගත හැකි ය.
- පහළ මූල්‍ය සාක්ෂරතාවක් සහිත ප්‍රජාව ඉලක්ක කර ගෙන රටේ සමස්ත මූල්‍ය සාක්ෂරතාව ප්‍රවර්ධනයට කටයුතු කිරීම.
- සියලු ම රැකියාවන්හි ඉලක්ක උසස්වීම් සඳහා කිසියම් ශ්‍රේණියක් ලබා දී මූල්‍ය සාක්ෂරතාව පරීක්ෂා කිරීමේ විභාග පැවැත්වීම.
- මූල්‍ය සාක්ෂරතාව පිළිබඳ නව පාඨමාලා විශ්වවිද්‍යාලයට ඇතුළත් කිරීම.
- රටේ සමස්ත ප්‍රජාව ආවරණය වන පරිදි ඒ ඒ මට්ටම්වලට අදාළව දැනුවත් කිරීමේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.
- මූල්‍ය සාක්ෂරතාව වර්ධනයට විශේෂ ව්‍යාපෘති හඳුන්වාදීම (සටහන සඟරාව, 2012).

උක්ත ක්‍රියාමාර්ග අනුගමනය කිරීම තුළින් රටක් සංවර්ධනය කරා යාමට ග්‍රාමීය අංශයේ මූල්‍ය සාක්ෂරතාව ඉහළ නැංවීමට ක්‍රියාමාර්ග ගත හැකි ය.

**සමාලෝචනය**

නූතන ලෝකය මුදල් පසු පස හඹායන ගෝලීයකරණ ආර්ථිකයකි. මෙහි දී ඇති නැති පරතරය හට ගැනීම නොවැලැක්විය හැකි කරුණකි. විශේෂයෙන් ශ්‍රී ලංකාව ඇතුළු සංවර්ධනය වන රටවල නාගරික හා ග්‍රාමීය අංශය අතර සංවර්ධනයේ පරතරයක් දක්නට ලැබේ. සංවර්ධනය වන රටවල නාගරික අංශයට සාපේක්ෂව නාගරික ජනගහනය ඉතා ඉහළ සංඛ්‍යාත්මක අගයක් ගනී. සංවර්ධනය යනු මානව සම්පත් සමඟ කරනු ලබන ක්‍රියාවලියකි. තවද රටක් සංවර්ධනය කරා යාමත් මූල්‍ය අංශයත් අතර නොමඳ සම්බන්ධතාවක් ඇත. ඒ නිසාවෙන් ග්‍රාමීය අංශය සංවර්ධනය මූල්‍ය සාක්ෂරතාව ඉහළ නැංවීම හේතු සාධකයක් වන බව නිගමනය කළ හැකි ය.

**ආශ්‍රිත ග්‍රන්ථ**

ශ්‍රී ලංකා මහ බැංකුව, (2013) *වාර්ෂික වාර්තාව*, මහ බැංකු ප්‍රකාශන අංශය, ඇම්.ඩී. ගුණසේන මුද්‍රණකරුවෝ, ශ්‍රී ලංකා මහ බැංකුව, කොළඹ 12.

මහජන බැංකුව, *ආර්ථික විමසුම*, මහජන බැංකු ප්‍රකාශන අංශය, 1988-නොවැම්බර්, 1996-මාර්තු, 2003-අප්‍රේල් කලාප, මහජන බැංකුව, කොළඹ.

මිර්ඩාල් ජී, *''දිළිඳු බවේ අභියෝග''*, මාර්ග ප්‍රකාශනය, මාර්ග පරිවර්තනය, 2002, මාර්ග අභ්‍යාස ආයතනය කොළඹ.

ශ්‍රී ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව. *''ශ්‍රී ලංකා දරිද්‍රතා විමසුම''*, 2009/10 වාර්තා, ශ්‍රී ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව. කොළඹ.

ග්‍රාම සංවර්ධන අභ්‍යාස හා පර්යේෂණ ආයතනය, *''ග්‍රාම සංවර්ධනය පිළිබඳ ශාස්ත්‍රීය සංග්‍රහය''*, 1978,2006 කලාප, ග්‍රාම සංවර්ධන අභ්‍යාස හා පර්යේෂණ ආයතනය, කොළඹ.

ශ්‍රී ලංකා මහ බැංකුව, *සටහන සඟරාව*, මහ බැංකු ප්‍රකාශන අංශය, 1985-මාර්තු, 1986-මාර්තු, 2014-සැප්තැම්බර්-ඔක්තෝම්බර් කලාප, මහ බැංකු ප්‍රකාශන අංශය, ඇම්.ඩී.ගුණසේන මුද්‍රණකරුවෝ, ශ්‍රී ලංකා මහ බැංකුව, කොළඹ 12.

සෝමසුන්දර, ඩී. 1991, *''සාර්ව ආර්කවිද්‍යාව''*, එස්. ගොඩගේ සහ සහෝදරයෝ, කොළඹ 12.

මිර්ඩාල්, ජී. 2002, *''දිළිඳු බවේ අභියෝග''*, මාර්ග ප්‍රකාශනය, මාර්ග පරිවර්තනය, මාර්ග අභ්‍යාස ආයතනය, කොළඹ.

Annual Report to the President (2008), *"President's Advisory Council on Financial Literacy (PACFL)"*, http://www.treas.gov/offices/domestic finance/ financial-institution/fineducation/council/index.shtml,viewed on 11 March 2015.

Central Bank of Srilanka 2013, Economic and social statistics of Sri Lanka, Central Bank of Srilanka, Colombo 12.

Chen, H. & Volpe, R.P. (1998), *"An Analysis of Personal Financial Literacy"*, Among College Students Available, https://www.cgsnet.org/ ckfinder / userfiles / files /An_Analysis_of_Personal, viewed on 29 August 2015.

Christable, P.J. & Vamalraj, A. (2012) *"Financial inclusion in rural india, the rule of mcro finance as a tool"*, Journal of Humanities and Social Science. http:// www.iosrjournals.org/iosr – jhss/papers/Vol2-issue5/ D0252125. Pdf, viewed on 28 July 2015.

Delavande, A. & Rohwedder, S. & Willis, R. (2008). *"Preparation for Retirement, Fnancial Literacy and Cognitive Resources"*, Michigan, Research Center Working Paper, No. 190.

Financial_Lit_Among_College_Students.pdf, viewed on 20 July 2015.

Lusardi, A. &. Mitchell, O.S. (2008), *"Planning and Financial Literacy: How Do Women Fare?"* American Economic, viewed on February 2015 : 413-417.

Master Card Worldwide (2011), *"How Well Do Women Know Their Money"*, Financial Literacy Across Asia / Pacific, Middle East, and Africa.

Moore, D. (2003), Survey of Financial Literacy in Washington State, *"Knowledge, Behavior, Attitudes, and Experiences".* Technical Report n. 03-39, Social and Economic Sciences Research Center, Washington State University.

Monticone, C. (2010), *"How Much Does Wealth Matter in the Acquisition of Financial Literacy?"*, The Journal of Consumer Affairs, Vol.44 (February): 403-422.

Xu, L., & Zia, B. (2012). *"Financial literacy around the world: An overview of the evidence with practical suggestions for the way forward"*, policy research working paper No. 6107, World Bank, Washington, DC.